# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1865/36 - 2014 ජුනි මස 06 වැනි සිකුරාදා - 2014.06.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### අංක 1670/33 දරන 2010.09.10 දිනැති හා අංක 1695/15 දරන 2011.03.01 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයන්හි පළ කරනු ලැබූ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය

අංක 1670/33 දරන 2010.09.10 දිනැති හා අංක 1695/15 දරන 2011.03.01 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයන්හි පළකරනු ලැබූ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 6.2, 6.3, 7.4.2.4 , 8.1, 8.2, 10.3.1 හා 10.3.2 වගන්ති පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

6.2 අනුමත තනතුරු නාම :

| | ශ්‍රේණිය | තනතුරු නාමය |
|---|---|---|
| 1. | III ශ්‍රේණිය<br>II ශ්‍රේණිය<br>I ශ්‍රේණිය | ගණකාධිකාරී, මූල්‍ය නිලධාරී, අභ්‍යන්තර විගණක |
| 2. | I ශ්‍රේණියේ නිලධාරියෙකු විසින් දැරිය යුතු බවට හඳුනාගත් තනතුරු | ප්‍රධාන ගණකාධිකාරී, ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| 3. | විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු විසින් දැරිය යුතු බවට හඳුනාගත් තනතුරු | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්), ප්‍රධාන මූල්‍ය නිලධාරී, අධ්‍යක්ෂ ජනරාල්, අතිරේක අධ්‍යක්ෂ ජනරාල් |

අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ හා සහකාර අධ්‍යක්ෂ යන නිලනාම මහා භාණ්ඩාගාරයේ දෙපාර්තමේන්තුවල අදාළ තනතුරුවල රාජකාරී ස්වභාවය හා සේවයේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් එබඳු තනතුරුවලට පත්කෙරෙන ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරීන් විෂයයෙහි භාවිතා කෙරෙන බවත් සැලකිල්ලට ගන්නා ලදුව, එබඳු දෙපාර්තමේන්තුවල ගණකාධිකාරීවරයෙකුගේ/අභ්‍යන්තර විගණකවරයෙකුගේ රාජකාරියෙහි නියැලෙන අය සම්බන්ධයෙන් හැර, මහා භාණ්ඩාගාරයේ දෙපාර්තමේන්තුවල ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I, II හා III ශ්‍රේණි සඳහා එකී නිලනාම තවදුරටත් භාවිතා කිරීම ක්‍රියාත්මක වනු ඇත.

6.3 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : 1600 (III, II හා I ශ්‍රේණි)

7.4.2.4. පළපුරුද්ද - සේවා පළපුරුද්ද බඳවා ගැනීමේදී අතිරේක සුදුසුකමක් වනු ඇත.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු පරිපාටියට - අදාළ ක්ෂේත්‍රය තුළ සේවා පළපුරුද්ද සඳහා
එක් වසරකට ලකුණු 05 බැගින් - උපරිම ලකුණු 15

1A - G 19673— 65 (2014/06)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

08. කාර්යක්ෂමතා කඩඉම

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග | කාර්යක්ෂමතා කඩඉම ඉක්මවා යන්නේ කොපමණ වසර ගණනකට පසුවද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත/ වෘත්තීය/ සහතික පාඨමාලා / වෙනත් |
|---|---|---|
| 3 වැනි කාර්යක්ෂමතා කඩඉම | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියට උසස්වීමෙන් වසර පහක් ඉකුත්වීමෙන් පසු | "7" වැනි පරිශිෂ්ඨය බලන්න |

8.2 පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද : කාර්යක්ෂමතා කඩඉම් විභාග වසරකට දෙවරක් පවත්වනු ලැබේ.

10.3.1 පහත අවශ්‍යතා සම්පූර්ණ කරනු ලැබූ I ශ්‍රේණියේ නිලධාරීන් උසස් කිරීම මගින් පමණක් විශේෂ ශ්‍රේණියට පත් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරනු ලැබේ.

i. අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබිය යුතුය.

ii. උසස්වීම් සඳහා සුදුසුකම් ලබන දිනට විධායක සේවා ගණයේ පළමු ශ්‍රේණියේ වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා පළමු ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වැටුප් වර්ධක 5 ක් උපයාගෙන තිබීම.

iii. උසස්වීම සඳහා සුදුසුකම් ලබන දිනට සුදුසුකම් ලබන සේවා ගණයේ/තනතුරුවලට අදාළව විධායක සේවා ගණයේ වසර 18 කට නොඅඩු සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

iv. උසස්වීම් සඳහා සුදුසුකම් ලබන දිනට පූර්වාසන්න වසර 05 තුළ වාර්ෂික කාර්ය සාධනය සතුටුදායක හෝ ඉහළ මට්ටමක පැවතීම.

v. උසස්වීම සඳහා සුදුසුකම් ලබන දිනට පූර්වාසන්නතම වසර 05 තුළ සතුටුදායක සේවා කාලයක් තිබීම හා විනයානුකූල දඬුවමකට ලක් නොවී තිබීම.

10.3.2 උසස් කිරීමේ ක්‍රමය

රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය ද සැලකිල්ලට ගෙන පවත්නා පුරප්පාඩු අනුව උසස් කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය පරිදි,

ටී.එම්.එල්.චන්ද්‍රානි සේනාරත්න,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2014 මාර්තු මස 31 දින,
කොළඹ 05,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදී ය.

06-600

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.